# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1816/32 - 2013 ජුනි මස 28 වැනි සිකුරාදා - 2013.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**අංක 1670/32 හා 1783/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයන්හි පළ කරනු ලැබූ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය**

2010.09.10 වැනි දින අංක 1670/32 හා 2012.11.09 වැනි දින අංක 1783/37 දරන *අති විශේෂ ගැසට් පත්‍රයන්හි* පළ කරනු ලැබූ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය 10.3.1 වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

**10.3.1** පහත අවශ්‍යතා සම්පූර්ණ කරනු ලැබූ I ශ්‍රේණියේ නිලධාරීන් උසස් කිරීම මගින් පමණක් විශේෂ ශ්‍රේණියට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලැබේ.

i. අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතු ය. ("ඉ" පරිශිෂ්ඨයේ සඳහන් පරිදි)

ii. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට විධායක නිලධර ගණයේ පළමු ශ්‍රේණියේ වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක 05ක් උපයාගෙන තිබීම.

iii. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට සුදුසුකම් ලබන සේවා ගණයේ/තනතුරුවලට අදාළ විධායක ශ්‍රේණියේ වසර 18 කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iv. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර 05 තුළ වාර්ෂික කාර්යය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

v. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්නතම වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම හා විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබීම.

**උසස් කිරීමේ ක්‍රමය :**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව ද සැලකිල්ලට ගෙන පවත්නා පුරප්පාඩු අනුව උසස් කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ටී. එම්. එල්. චන්ද්‍රානි සේනාරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2013 ජුනි මස 28 වැනි දින,
කොළඹ 05,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දී ය.

07 - 259


1A - G 017849 — 315 (2013/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*